## සෙනසුරාදා

<u>පළමුවන කියැවීම</u> 1 මකබි 6: 1-13

**"ජෙරුසලෙම්හි දී මා කළ නපුර ගැන බියෙන් මැරී යමි."**

ඇන්ටිඔකස් රජ උතුරු පළාත් ඔස්සේ යමින් සිටියේ ය. තවද, පර්සියාවේ එලිමයිස් නම් නගරයක් ගැන ඔහුට අසන්නට ලැබිණි. මේ නගරය එහි වූ ධන සම්පත් හා රන් රිදී නිසා ද ග්‍රීක් ජාතියක් පළමුවෙන් ම පාලනය කළ ග්‍රීසියේ රජු වන පිලිප්ගේ පුත් ඇලෙක්සැන්ඩර්, රන් යුද ඇඳුම්, ළය වැසුම් සහ වෙනත් අවි ආයුධ තැන්පත් කළ ඉතා ඉසුරුමත් දේවාලය නිසා ද මහත් කීර්තියක් ඉසිලී ය. එබැවින් ඔහු ගොස් ඒ නගරය අල්ලාගෙන එය කොල්ලකන්නට උත්සාහ කළ නමුත් එය සාර්ථක නොවී ය. මන්ද, එහි පුරවැසියන් ඔහුගේ සිතුම් පැතුම් දැනගෙන ඔහුට විරුද්ධ ව තදින්ම සටන් කළ බැවිනි. එවිට ඔහු ආපසු හැරී කණගාටුවෙන් බැබිලෝනියාව බලා ගියේ ය. එහෙත් ඔහු පර්සියාවේ සිටිය දී ම, ජුදා දේශය ආක්‍රමණය කළ හමුදාවක් පරාජය වූ බව ඔහුට සැළ විය. විශේෂයෙන් ලිසියස් ඉමහත් සේනාවක් සමඟ ඉදිරියට ගිය නමුත් ඔහුට ජුදෙව්වරුන් ඉදිරියෙන් බලයෙන් ම ආපසු හැරී පලා යන්නට සිදු වූ බව ද, ජුදෙව් හමුදාවන් විසින් කැබලි කරනු ලැබූ සේනාවලින් ලබා ගත් යුද්ධායුධවලින් ද, ආහාර පානාදියෙන් ද, අධික කොල්ලයෙන් ද ඔවුන් බලසම්පන්න වී සිටින බව ද, ජෙරුසලම් පූජාසනය උඩින් තමා ඉදිකරවූ 'පිළිකුල් දූෂිතය ජුදෙව්වන් විසින් විනාශ කරනු ලැබූ බවද, රට කලින් වූ පරිදි ශුද්ධාස්ථානය උස් ප්‍රාකාරවලින් වට කොට, ඔහුගේ නගරයක් වූ බෙත්ශූර් ශක්තිමත් කර තිබෙන බව ද ඔහුට සැළ විය. රජ තෙම මෙය ඇසූ විට මවිතයට පත් වී තදින් කම්පා විය. තමා බලාපොරොත්තු වූ අන්දමට කිසිවක් සිදු නොවූ නිසා ඔහු යහන මත වැතිර දැඩි සිත් වේදනාවෙන් මලානික වී සිටියේ ය. මෙලෙස ඔහු බොහෝ දින ගණනක් මලානික ගතියෙන් සිටින අතර නොයෙක් වර සිහිසන් නැතිව යන්නට ද වූයෙන් තමා මැරෙන්නට යන බව ඔහු තේරුම් ගත්තේ ය.

එවිට ඔහු තම මිත්‍රයන් සියලු දෙනා කැඳවා, ඔවුන්ට කථා කොට, 'මාගේ දෙනෙතට නින්ද නැත. මම ද සිත් තැවුලින් බියට පත් වී සිටිමි. මට ධන සම්පත් තිබුණු අවදියේ මම ඉතා ත්‍යාගශීලී ව ප්‍රේමය ලබා සිටියෙමි. එහෙත් දැන් ගංවතුරක් වැනි මහා කරදරයක මා වෙලී පැටලී ගිලී සිටීමට හේතුව කුමක්ද? මගෙන් ම මම ප්‍රශ්න කරගනිමි. මා ජෙරුසලමේ දී එහි සියලු රන් රිදී භාජන පැහැර ගැනීමෙන් ද කිසිම හේතුවක් නැතිව ජුදා දේශයේ වැසියන් සමූල ඝාතනයෙන් වනසාලීමට අණ කිරීමෙන් ද මා එහි දී කළ වැරදි මට දැන් සිහි වේ. මට මේ සා මහත් කාලකණ්ණිකමක් පැමිණ තිබෙන්නේත්, විදේශීය රටක දී මා මලානික ගතියෙන් මරණාසන්න වී සිටින්නේත් මක්නිසාද? ඊට හේතුව මට දැන් පැහැදිලි වී ඇතැ'යි කීවේය.

දේව වචනය මෙසේ ය.

**පිළිතුරු ගීය**

ගීතාවලිය 9: 1-3, 5, 15, 18

පිළිතුර: සමිඳුන්ගේ අසිරිමත් ක්‍රියා නිසා තුති පුදමු.

ගීය:

සමිඳුනි, හද පත්ලෙන් ම මම ඔබ හට තුති පුදමි. ඔබ කළ අසිරිමත් ක්‍රියා පතුරා හරින්නෙමි.
ඔබ ගැන සිත සිතා කුල්මත් වී උදනන් අනන්නෙමි.
මහෝත්තමයාණෙනි, ඔබේ නම ප්‍රශස්ති ගීතයෙන් පසසන්නෙමි.

ඔබේ අගමනය නරඹා සතුරෝ පසු බැස යති. පැකිළී වැටෙති.
වැනසෙති. ජාතීන්ට තරවටු කොට, අදමිටුවන් විනාශ කොට,
ඔවුන්ගේ නම සදහට ම මකා හරින සේක.
ඔවුන්ගේ නගර සුණු විසුණු කර ඇත. ඒවායේ නම් ගම් මතකයෙන් පහ කර ඇත.

විජාතීහු වළක් කපා එම වළේ වැටී සිටිති.
එලෙසම උගුලක් අටවා එම උගුලට අසු වී සිටිති.
දිළිඳා හැමදා අමතක නොවනු ඇත. පීඩිත අයගේ පැතුමන් සදහට ම යටපත් නොවනු ඇත.

සුපුවත් ජය නද (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!
සරු බිමේ වැපුරු බීජ යන්නෙන් අදහස් කරනුයේ
අවංක පිරිසිදු සිතකින් වචනය අසා, පිළිපැද
නොපසුබට වීර්යයෙන් පල දරන අය ය.
ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!
අපේ මිදුම්කරුවාණන් වන ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ මරණයේ බලය බිඳ දමා ජීවනයත් අමරණීය භාවයත් සුබ අස්න මගින් හෙළිකර වදාළ සේක.
ආලේලූයා!

සුවිශේෂය

ලූක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

ලූක් 20 : 27-40

**"උන්වහන්සේ මළවුන්ගේ දෙවියන් වහන්සේ නොව ජීවතුන්ගේ දෙවියන් වහන්සේ ය."**

පුනරුජ්ජීවනයක් නැතැ යි කියන සද්දුසිවරුන්ගෙන් සමහරෙක් ජේසුස් වහන්සේ වෙත අවුත් "ගුරුදේවයෙනි, යම් මිනිසකු භාර්යාව ජීවත් ව සිටියදී දරු පල නොලැබ මළොත්, ඔහුගේ සහෝදරයා ඒ භාර්යාව පාවා ගෙන තම සහෝදරයාගේ නමට දරුවන් ඉපදවිය යුතු යයි මෝසෙස් ලියා ඇත. ඉදින් සහෝදරයෝ සත් දෙනෙක් සිටියහ. පළමුවැන්නා දෙවැන්නාත් තුන් වැන්නාත් ඇය පාවා ගත්හ. සත් දෙනම එසේ දරු පල නොලබා මළෝය. පසුව ඒ ස්ත්‍රියත් මළා ය. සත් දෙනාම ඇ පාවා ගත් බැවින් පුනරුජ්ජීවනයේ දී ඇ ඔවුන්ගේ කවරෙකුගේ භාර්යාව වන්නී දැ"යි ඇසූහ. ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින් "මේ යුගයට අයත් වූවෝ ආවාහ විවාහ වන්නාහු ය. එහෙත් මතු යුගයට හා පුනරුජ්ජීවනයට පැමිණීමට වරම් ලත් අය ආවාහ වන්නේ වත් විවාහ වන්නේ වත් නැත. ඉන්පසු ඔවුන්ට මරණයක් නැත. ඔව්හු දේව දූතයන්ට සම වෙති. පුනරුජ්ජීවන වරය ලත් බැවින් ඔව්හු දෙවියන් වහන්සේගේ පුත්‍රයෝ ය. "ස්වාමීන් වහන්සේ ආබ්‍රහම්ගේ දෙවියන් වහන්සේ ය. ඊසාක්ගේ දෙවියන් වහන්සේ ය. ජාකොබ්ගේ දෙවියන් වහන්සේ ය"යි කීමෙන් මෝසෙස් පවා පුනරුජ්ජීවනයක් ඇති බව පඳුර පිළිබඳ පාඨයෙහි පෙන්වා දී ඇත. උන්වහන්සේ මළවුන්ගේ දෙවියන් වහන්සේ නොව ජීවතුන්ගේ දෙවියන් වහන්සේ ය. මන්ද, උන්වහන්සේ උදෙසා සියල්ලෝම ජීවත් වෙති"යි වදාළ සේක. එවිට විනයධරයන්ගෙන් සමහරෙක් උත්තර දෙමින් "ගුරුදේවයෙනි, ඔබේ කතාව කදිම"යි කීහ. උන්වහන්සේගෙන් තවත් කිසි ප්‍රශ්නයක් ඇසීමට ඔවුන්ට ධෛර්යය නොතිබිණි.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.